# <u>ආගමක් හෝ විශ්වාසයක් දැරීමට ඇති නිදහස උදෙසා සමාවදීම ,ඉවසීම, හා විශ්වාසය යනාදී මානුෂීය ගුණාංග</u>

මිනිසත් බව ලබා මනුලොව පා තබන විට
රුහිරු බැදුණු බැමි බාධක දෙවෙනි කොට
දෝස නැතිව ගුණ දම් මන බදින විට
අත්වැල් බදිමු අපි සැම මිතුරන් ලෙසට

කුල මල බේද දුරලා පියපත් සලලා
නිවට සිතුම් පවිටු පැතුම් බිඳ හෙලලා
සැම හා දයාවෙන් එකිනෙක හා බැදිලා
විශ්වාසය රකිමු සැම දන එකතුවෙලා

මනුසත් බවින් යහගුණයෙන් ඔප වැටිලා
ඉවසුම් ගෙනෙයි සැම හට යහපත මවලා
මනුසත් ගුණෙන් සැම අදහස් පන පොවලා
සමරමු නිදහසේ මිහිරිය සැම දන එකතුවෙලා

රැවුම් රිදවුම් වියැකිලා ගොස් සිනා කදුලැලි පසක්වන්නේ
අවුල් වියවුල් සිතින් දුරලා පිබිදෙනා මනසක් තනන්නේ
එකිනෙකා උදෙසා උණුවෙන රුහිරු ගගුලක් ගලායන්නේ
සැමට නිවහල් ලොවක් තැනුමට ලොවේ සැමදන වෙහෙසවන්නේ

මිදී පළගැටි සිහිනයෙන් සැම පැතුම් සහසක් පුරවලා
නිබඳ රැකගමු සියලු ආගම් සැවොම බැතියෙන් පවසලා
උරෙන් උර එකිනෙකා වෙනුවෙන් බැදී දුක් ගැට උසුලලා
මිනිස්කම පිරි ලොවක් තැනුමට බැදෙමු අප සැම එක්වෙලා

සම්පූර්ණ නම - මධූකා සත්සරණි
තරග අංශය - කවි
වයස් කාණ්ඩය - අවු 27
හැදුනුම්පත් අංකය - 946120766 V
විද්යුත් තැපෑල - madusarani046@gmail.com